


අපගේ යුතුකමක් මෙන් ම වගකීමක් ද වන නිසා-වෙනි, ඒ.

"ගී සඳළුව" ලිපිය ද ජගත් ජේ. එදිරිසිංහයන්ගේ ම අදහසකි. ආල්බ්‍ය චිත්‍ර නැතහොත් පුද්ගලයින්ගේ රූප (Portraits) ඇඳීමට මා තුළ වූ හැකියාව දත් ඔහු ඊට වේදිකාවක් ලෙසින් ගී නිර්මාණ පසු බිමෙහි ඇති ඕපාදූප ලිවීමට ඉඩ කට ලබා දුන්නේය. ඊට මම "ගී සඳළුව" යැයි නම් කළ අතර ලාංඡනයට චිත්‍ර සටහනක් යැවූයෙමි. "පන්හිඳයි - පින්සලයි" ලාංඡනය මෙන් ම "ගී සඳළුවේ" ලාංඡනය ද ඒ අනුව ජගත් විසින් නිර්මාණය කරන ලදී.

ඉහත ලිපි දෙක මූලික කොටගෙන "සන්නස" වෙනුවෙන් දිය හැකි දායකත්වය පසුගිය වසර දහය පුරාවට ලබා දුන්නේ ඉමහත් සතුටිනි. ඒ වෙනුවෙන් සන්නසින් මා ලද දේ ද බොහෝයි. ලිවීමේ හා ඇඳීමේ පන්නරය මුවහත් කරගැනීමට ලද අවස්ථාව මෙන්ම අපගේ පිරිස අතර මා පිළිබඳ යම් ප්‍රසාදයක් වේ නම්, එයට ද ඒක් අතකින් සන්නසින් ලැබුණ සම්මාදම ද අගේ කළ යුතුය.

ජගත්ගේ දැන හඳුනුම්කම් ඇත්ව සන්නස සමඟ මා එක් වුව ද, මාසයෙන් මාසයට මා ගනුදෙනු කරන්නේ සන්නස කතුවර අසෝක සුබසිංහ සොයුරාණන් සමඟින්ය. නිවී සැනසුන ගුණයෙන් යුතුව, සුහදව, ඉවසිලිවන්තව කටයුතු කරන අසෝක අපගේ ප්‍රමාදයන් ඉවසීමත්, අප අතර ඇති වන විවිධ මති මතාන්තර සමබරව විඳ දරා ගැනීම නිසාම .... ඒ නිසාම ඇතිවන අරගලවලට මැදිහත්වීමත් මා හටනම් අදහාගත නොහැකි තරම් !.

"සන්නස" පිරවර ලෙසින් අප මේ ආ ගමන පහසු ගමනක් නොවේ. නාට්‍යයක සෑම චරිතයන් ම එක හා සමාන වී නම් එය නාට්‍යයක් වේ ද ? අපගේ පිරිවර ද එසේ ම ය. මා වැඩි වශයෙන් ම අභියෝග කර ආරවුල් ඇති කරගත්තේ අපගේ ජ්‍යෙෂ්ඨ හිතවතා වන ජගත් ජේ. එදිරිසිංහයන් සමඟින් ම යි. අවසන අපි දෙදෙනා ම කඳුළු සැළුවෙමු. ඒ ඇවිළුනේ රුපියල් - ඩොලර් හෝ පෞද්ගලික දේ සඳහා නම් නොවේ. පාඨකයින් වෙනුවෙන් හෝ කෙදිනක හෝ අප දෙ-දෙනාට ම නිවැරදි විය යුතු තැන වලදී ඒ වෙනුවෙන් කෙළින් ම කළ මත ප්‍රකාශ වෙනුවෙනි.

මේ අතර ලද මඩ ප්‍රහාර, නොයෙකුත් කණ්ඩායම්වල කෙනෙහිලිකම්, කොන් කිරීම්, නොසලකා හැරීම්, පෙත්සම්, කැලෑ පත්තර වැනි දේට හේතු වූයේ විශේෂයෙන් ම අප "සන්නස" මාසිකයට ලියූ දේයි. මුල් කාලයේ "පන්හිඳයි - පින්සලයි" පිටුව පිළිස්සූ සිද්ධියක් ද අසන්නට ලැබිණ. එමෙන් ම මෙල්බන් අපේ සමාජයට අමිළ සේවයක් කළ මාලනී ජයසිංහ මහත්මිය මිය යාමට පෙර ගිලන් ඇඳේදී අවසන් වරට කියවූයේ ඇය පිළිබඳ ව ම ලියැවුණ "පන්හිඳයි - පින්සලයි" පිය යැයි ද ශ්‍රීනාත් මද්දුමගේ සොයුරාගෙන් දැනගන්නට ලැබිණ. ශ්‍රීනාත් එහි ඡායාරූපයක් පවා පළ කළේය.

මාගේ මව පියා මිය යන තෙක් ම මා මෙහි පුවත්පත්වලට ලියූ ලිපි මව් බිම සිටින ඇයට යැව්වෙමි. විශ්‍රාමික සිංහල ගුරුවරියක වූ ඇත ඒවා තමන් කියවූවා පමණක් නොව අසල් වාසීන්ට ද නිවසට පැමිණෙන නෑ හිතවතුන්ට ද පෙන්වා කියැවීමට දුන්නාය. ගමේ පන්සලේ නා හිමියන්ට ද ඉදිරිපත් කළා ය. එදා ඈ ඒ ලැබූ සතුටේ වැඩි කොටසක්ම "සන්නස" මාවිකය නිසා බව නොකියා ම බැරිය. අප ජීවිතයේ ලබන උපරිම සතුට වන්නේ දෙමව්පියන්ගේත්, අඹු දරුවන්ගේත් සතුටයි. දිවන්ගත මා මෑණියන් සතුටු කිරීම වෙනුවෙන් යම් පිනක් සිදු වී නම් එහි කොටසක් සන්නසටත් හිමි වෙයි. ඒ පිනෙන් සන්නස දිනෙන් දින හරවත්ව, රසවත්ව රසිකයින් අතරට පත් වීමට අවැසි සියළු දේ සම්පූර්ණ වේවා ! ය යන්න මාගේ පැතුමයි

## සන්නස ට අපේ සුබ පැතුම්

වසර 2005 අප්‍රේල් මාසයේදී ඇරඹි සන්නස පුවත්පත මේ වසරේ දසවන වර්ෂ පූර්ණය සමරයි. නවීන මාධ්‍ය තාක්ෂණය උපරිම ආකාරයෙන් තරග කරන මෙවන් අවදියක ඒවා ජය ගනිමින් වසර දහයක් පැවතීම උදෙසා සන්නස කාර්ය මණ්ඩලය කර ඇති කැප කිරීම සුලු පටු නොවේ . අද වන විට අන්තර්ජාලය ඔස්සේද සන්නස කියවමින් ලෝ පුරා විසිරුණ පාඨකයන් රැසක් බිහිවී ඇත්තේද ඒ අසීමිත කැප කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව අපට පෙනෙයි.

කියවීම මිනිසා සම්පූර්ණ කරයි යන්න ආප්තෝපදේශයක් බවට පමණක්ම සීමා වී ඇති කාලයක අපේ සමාජය යළිත් කියවන මිනිසුන් සිටින සමාජයක් බවට පත් කිරීමට සන්නස ගන්නා දුෂ්කර ඉලක්කය අප අගය කළ යුතුමය. සන්නස වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නෙතට රසඳුනකි. පාඨකයන්ට දැනුම් සම්භාරක් ලබා දෙන තෝතැන්නකි. විවෘත සංවාදයන්ට කදිම වේදිකාවකි.



සෑම විටම සත්‍යය වෙනුවෙන් පෙනී සිටීමද යහපත් සමාජයක් පිළිබඳව සිහින දැකීමද අරමුණු කර ගනිමින් බොහෝ දුර ගෙවූ සන්නසට ආ මගට වැඩි දුරක් ඉදිරියට යාමට සිදුව ඇත. ඒ ගමනට නිරතුරුව ශක්තිය හා ධෛර්යය අපෙන් ලැබෙන අතර කියවීම තුළින් ජන සමාජය තුළ උත්තේජනයක් ඇති කිරීමේ යහපත් අරමුණට අපේ සුබ පැතුම් මෙසේ එක් කරමු

**ප්‍රසන්න ලෙනෝරා**
සභාපති - ශ්‍රී ජයවර්ධනපුර විද්‍යාර්ථීන්ගේ සංගමය

## සන්නසට සුබ පැතුම් !

තොරතුරු පිපාසයට දිය බිඳකි සන්නස පුවත්පත අවුරුදු දහයක් පුරාවට කාලීන සමාජීය තොරතුරු සමඟ විවිධ මාතෘකා ඔස්සේ අප හද බැඳගත් සන්නස පුවත් පත පවුලේ හිතවතකු වැනිය. ඕස්ට්‍රේලියාවේ වෙසෙන අපට දෛනික කාර්ය බහුලත්වය මැද හැඟීමක් දැනීමක් ගෙනදුන් සන්නස පුවත් පතේ දසවසරක සංවත්සරයට මෙසේ සුභාසිංශනය කරමු. එසෙම එහි සාර්ථකත්වය පිටුපස සිටින කාර්ය මණ්ඩලයට දිරිය පතමු !



**මිල්කින් බණ්ඩාරනායක**
සම්බන්ධීකරණ නිළධාරී
St. Albans සිංහල භාෂා පාසල